**තල් සංවර්ධන මණ්ඩලය - 2015**

---------------------------------------

තල් සංවර්ධන මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 44 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට තල් සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංරාගිප්‍ර) අනුකූල වීම

ශ්‍රී ලං රා ගි ප්‍ර 7 - දේපල, පිරියත හා උපකරණ -: පෙර වර්ෂ වලදී රු.8,063,716 ක පිරිවැයකට මණ්ඩලය විසින් ප්‍රසම්පාදනය කරන ලද හා සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ප්‍රමිතියේ 65 වගන්තිය ප්‍රකාරව ඒවායේ ප්‍රයෝජනවත් ජීවකාලය සමාලෝචනය කිරීමෙන් තොරව හා වෙනස්කම් ගිණුම්ගත කිරීමෙන් තොරව උපයෝජනය කරමින් පැවතුණි.

#### 2.2.2. හඳුනා නොගත් වෙනස්කම්

ලෙජර ගිණුම්වල දැක්වෙන විෂයයන් 06 ක වටිනාකම හා සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම අතර එකතුව රු.1,036,137 ක වෙනස්කම් නිරීක්ෂණය වූ අතර එම වෙනස්කම් සඳහා හේතු හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.3. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 5 කට වැඩි කාලයක් වූ තුන්වන පාර්ශවයකට ලබා දෙන ලද රු.1,444,866 ක අත්තිකාරමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කිරීමෙන් තොරව රු.5,293,588 ක් වර්ෂ 6 කට වැඩි කාලයක් ගෙවිය යුතු ශේෂ යටතේ දක්වා තිබුණි.

(ඇ) රු.18,000 ක් වූ උත්සව අත්තිකාරම් වර්ෂ 6 කට වැඩි කාලයක් හිඟ ශේෂ යටතේ දක්වා තිබූ අතර එම ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

#### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති රු.59,180,659 ක් වටිනා ගනුදෙනුවලට අදාළ පහත දැක්වෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයයන් | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් හා ගොඩනැගිලි | 50,094,735 | තක්සේරු වාර්තා |
| සේවක ණය හා අත්තිකාරම් | 259,172 | පුද්ගලික ණය ලිපිගොනු |
| කුලී ගෙවීම් | 7,791,247 | තක්සේරු වාර්තා |

| | | |
|---|---|---|
| ඉන්ධන වියදම් | 851,065 | නිලධාරීන්ගේ අත්සන් හා ගමනේ අරමුණ |
| විදුලි වියදම් | 184,440 | මුල් බිල්පත්‍ර |

**2.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ)** | **1971 අංක 38 දරන මුදල් පනත** | |
| i | 12 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය සහිතව අදාළ අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ආකෘතිය හා අන්තර්ගතය තීරණය කළ යුතු වුවද එසේ සිදු කර නොතිබුණි. |
| ii | 14(3) වගන්තිය | 2012,2013 හා 2014 වර්ෂ සඳහා මණ්ඩලයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| i | මුදල් රෙගුලාසි 110 | අවශ්‍ය පරිදි පාඩු හා හානි ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| ii | මුදල් රෙගුලාසි 135 | මණ්ඩලයේ සභාපති විසින් මූල්‍ය බලතල විධිමත් පරිදි පවරා නොතිබුණි. |
| iii | මුදල් රෙගුලාසි 272 (3) | ගෙවීම් වවුචර් අදාළ මාසයේ අවසානය සිට සති 6 ක් ගත වීමට පෙර මාසිකව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| iv | මුදල් රෙගුලාසි 445 | දිස්ත්‍රික් කාර්යාල හා මධ්‍යස්ථාන විසින් ඉන්වෙන්ට්‍රි ලේඛන විධිමත් පරිදි පවත්වා නොතිබුණි. |
| v | මුදල් රෙගුලාසි 715 | මණ්ඩලයට අයත් මධ්‍යස්ථාන විසින් විධිමත් ගබඩා පරිපාටි අනුගමනය කර නොතිබුණි. |
| vi | මුදල් රෙගුලාසි 751 (i) | මිලදී ගැනුම් සටහන් කිරීමේදී හා තොග පොත්වල ඉන්වෙන්ට්‍රි පවත්වා ගැනීමට අදාළව විවිධ අඩුපාඩු නිරීක්ෂණය විය. |
| vii | මුදල් රෙගුලාසි 756 (5) | ලැබීම්, නිකුත් කිරීම් හා ඉදිරියට ගෙන යන ශේෂය පැහැදිලිව දැක්වෙන පරිදි ඉන්වෙන්ට්‍රි ලේඛනය විධිමත්ව පවත්වා නොතිබුණි. තොග සමීක්ෂණය සඳහා මණ්ඩලය විසින් නියමිත ආකෘති භාවිතා කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| viii | මුදල් රෙගුලාසි 757 (1)(ඇ), (2)(අ) සහ (2)(ඇ) | (i) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා අප්‍රමාදව සභාපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| | | (ii) | පෙර වර්ෂ සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා මඟින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳවද කටයුතු කර නොතිබුණි. |
| | | (iii) | සමීක්ෂණ මණ්ඩල වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| ix | මුදල් රෙගුලාසි 1010 (ආ) | | වාහන පිළිබඳව භෞතික සමීක්ෂණයක් මණ්ඩලය විසින් සිදු කර නොතිබුණි. |

(ඇ) **2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය**

| | | |
|---|---|---|
| i | 4.2.2 ඡේදය | සැලැස්මට අනුකූල වන පරිදි තථ්‍ය කාර්ය සාධනය තහවුරු කර ගැනීම සඳහා මණ්ඩලය විසින් එහි සංයුක්ත සැලැස්ම, අයවැය ලේඛනය හා කාර්ය සාධනය කාලීනව සමාලෝචනය කර නොතිබුණු අතර විචලනයන් හා පුළුල් වෙනස්කම් පිළිබඳ පිළියම් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. |
| ii | 4.2.5 ඡේදය | මණ්ඩලය විසින් එහි කාරක ප්‍රාග්ධනය පිළිබඳ ඵලදායී කළමනාකරණය සඳහා පද්ධති සකස් කර නොතිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී පහත සඳහන් ප්‍රකාශන මාසික පදනමින් සමාලෝචනය කර නොතිබුණි. |

(අ) ණයගැතියන් හා ණයහිමියන් පිළිබඳ කාල විශ්ලේෂණය

(ආ) තොග පිළිබඳ කාල විශ්ලේෂණය

(ඇ) පැරණි, සෙමින් චලනය වන හා යල්පැන ගිය තොග හා වෙනත් විෂයයන් හඳුනාගැනීමේ ප්‍රකාශන

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ වැඩ කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු.125,783,577 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.10,416,894 ක් වූයෙන් මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.115,366,683 ක තවදුරටත් පිරිහීමක් දැක්වුණි. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් හේතුවෙන් රු.131,538,113 ක පර්යේෂණ හා සංවර්ධන වියදම හා පුහුණු වියදම සමාලෝචිත වර්ෂය සඳහා ආදායමට එරෙහිව අය කිරීම මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 125.78 ක ඌනතාවයක් වුවද, සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයෙන් රටට වන දායකය රු.මිලියන 200.89 ක් විය. එබැවින්

සමාලෝචිත වර්ෂය අවසානයට අගය එකතු කිරීම රු.මිලියන 75.11 ක් විය. සමාලෝචිත වර්ෂය අවසානයට හා පෙර වර්ෂ 4 ක් සඳහා අගය එකතු කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | 2015 | 2014 | 2013 | 2012 | 2011 |
|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| වර්ෂය සඳහා ඌනතාවය | (125.78) | (10.42) | (12.58) | (9.76) | (3.15) |
| **එකතු කළා -:** | | | | | |
| පුද්ගලික පඩි නඩි | 113.93 | 63.73 | 57.58 | 51.97 | 49.94 |
| වරිපනම් හා බදු | 0.03 | 0.04 | 0.04 | 0.01 | 0.03 |
| ක්ෂය | 86.93 | 12.12 | 13.16 | 8.62 | 6.31 |
| මුළු දායකය | 200.89 | 75.89 | 70.78 | 60.60 | 56.28 |
| අගය එකතු කිරීම | 75.11 | 65.47 | 58.20 | 50.84 | 53.13 |

සමාලෝචිත වර්ෂය සඳහා පුද්ගලික පඩිනඩි හා ක්ෂය වැඩි වීම, සමාලෝචිත වර්ෂයේ අගය එකතු කිරීම වර්ධනය වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මුළු මෙහෙයුම් වියදම රු. 155,929,309 ක් වූ අතර ඉන් රු. 113,933,123 ක් පුද්ගලික පඩිනඩි සඳහා දරා තිබුණි. එය මුළු වියදමින් සියයට 73 කින් නියෝජනය විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

පහත නිරීක්ෂණයන් කරන ලදී.

(අ) ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීම

මණ්ඩලය විසින් එහි නිෂ්පාදන මට්ටමේ වැඩි කිරීම මඟින් හා හකුරු, පැණි, පැණිරස රා, සූකිරි, බෝතල් කළ රා, විනාකිරි, බෝතල් කළ තලප, පන්නාඩු, පැණි පන්නාඩු, ජෑම්, කෝඩියල්, බීමට සූදානම් පානයන්, ඖෂධ මූල නිෂ්පාදන, අල (අලුත්), වියළි අල, වියළි අල පිටි, තම්බන ලද අල පිටි, පාම්පෝෂ, බිස්කට්, කේක්, සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත වේවැල් වැනි වියන ලද කූඩ, වියන ලද පුටු, කජු ඇසිරීම සඳහා පෙට්ටි, තේ සහ කුළුබඩු, තොප්පි, පැදුරු, කොසු, වුත් ප්‍රික්ස්, ස්කිව් ස්ටික්ස් ආදී ඉරටු නිෂ්පාදන මල් පෝච්චි, සැරසිලි, බිත්ති සැරසිලි, මල් පැල වගාව සඳහා වර්ධන මාධ්‍යයක් ලෙස කොහුබත්, පස්, ලවනීකරණ පාලනය තද කෙඳි සහිත විශාල බුරුසු, මධ්‍යම කෙඳිසහිත - පිරිසිදු කිරීම් හා ගෘහාශ්‍රිත බුරුසු, මෘදු කෙඳි සහිත කොසු, කටින නූල් කෙඳි අත්කම්, ඉදිකිරීමේ කාර්යයන්, ගෘහ භාණ්ඩ සෑදීම, චිප් බෝඩ් හා ඉන්ධන දර යනාදි විවිධ වර්ගයේ තල් නිෂ්පාදන අලෙවි කිරීම මඟින් ජාතික ආර්ථික වර්ධනයට හා සෞඛ්‍ය සම්පන්න සමාජයක් සඳහා දායක වීම ආදී ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවරයන් ගෙන නොතිබුණි.

(ආ) තික්කම් ස්කාගාර ව්‍යාපෘතිය මෙහෙයවීම

වදමරච්චි තල් සංවර්ධන සමුපකාර සමිති පොකුරු ව්‍යාපෘතිය සහ මණ්ඩලය අතර 2008 අප්‍රේල් 10 දින එළඹි බදු ගිවිසුම අනුව තල් සංවර්ධන මණ්ඩලය සතු වටිනා වත්කම් බදු

පදනම මත තල් සංවර්ධන සමුපකාර සමිතියට ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010, 2011, 2013, 2014 හා 2015 දෙසැම්බර් 31 දිනට බදු පදනම මත ලබාදුන් වත්කම්වල වටිනාකම මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි.

(ii) බදු ගිවිසුමේ 01 හා 02 ඡේද ප්‍රකාරව 2008 මැයි මාසයේ සිට මාසික රාජ්‍ය භාගය හා බදු කුලිය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) මණ්ඩලය විසින් ලබාදෙන ලද වටිනා වත්කම් භාර ගැනීමට තල් සංවර්ධන සමුපකාර සමිතිය කටයුතු කර නොතිබුණි. 2016 පෙබරවාරි 25 දින සිදු කරන ලද භෞතික පරීක්ෂණයේදී, වත්කම් රාශියක් උපයෝජනය නොකර හානි වී තිබූ බව අනාවරණය විය.

(ඇ) පාඩු පිට පවත්වා ගෙන යන ආදර්ශ ගොවිපොළවල්

ආදර්ශ ගොවිපොළවල් 5ක් අඛණ්ඩව පාඩු ලබමින් පවත්වා ගෙන ගොස් තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ හා පසුගිය වර්ෂ 03 ක කාලපරිච්ඡේදය තුළ දරන ලද පාඩු පහත දැක්වේ.

| **ආදර්ශ ගොවිපොළේ නම** | **වර්ෂ සඳහා ශුද්ධ පාඩුව** | | | |
|---|---|---|---|---|
| | **2015** | **2014** | **2013** | **2012** |
| | රු. | රු. | රු. | රු. |
| කුඩදනයි | 688,821 | 545,045 | 462,273 | 475,675 |
| මන්මුනෙයි | 608,282 | 694,221 | 571,755 | 759,630 |
| ඩෙල්ෆ්ට් | 60,000 | 61,620 | 380,044 | 61,180 |
| පුලියන්කුලම | 2,383,310 | 1,771,618 | 700,423 | 800,215 |
| වීරවිල | 2,302,275 | 1,415,480 | 1,718,931 | 1,954,470 |
| ශුද්ධ පාඩුව | 6,042,688 | 4,487,984 | 3,833,426 | 4,051,170 |

තවද පහත සඳහන් අක්කර 85 ක ප්‍රමාණයකින් යුත් ආදර්ශ ගොවිපොළවල් 2 ක් 2010 වර්ෂයේ සිට සම්පූර්ණයෙන් නිෂ්කාර්යව තිබෙන්ට ඉඩ හැර තිබුණි. විස්තර පහත පරිදි වේ.

| **ගොවිපොළ පිහිටි ස්ථානය** | **ඉඩමේ ප්‍රමාණය ( අක්කර)** |
|---|---|
| මන්මුනෙයි | 78 |
| අරිවියල් නගර් | 07 |
| එකතුව | 85 |

(ඇ) බීජ හා වගාකරන ලද බීජාංකුර පිළිබඳ කාර්යසාධනය

2012 වර්ෂයේ සිට 2015 දක්වා වර්ෂයන් තුළ බීජ හා වගාකරන ලද බීජාංකුර පිළිබඳ කාර්යසාධනය පහත පරිදි වේ.

| | වගාකරන ලද බීජ සංඛ්‍යාව | වගාකරන ලද බීජාංකුර සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|
| 2012 | 19,000 | 59,055 | 78,055 |
| 2013 | 90,130 | 51,560 | 141,690 |
| 2014 | 382,700 | 25,610 | 408,310 |
| 2015 | 1,183,755 | 4,000 | 1,187,755 |

ඵලදායී වගාවක් සඳහා උපායමාර්ගයක් ලෙස නොමැරී පැවැත්මේ අනුපාතය වැඩිකරගැනීම සඳහා 2012 වර්ෂයේදී බීජාංකුර වගාව හඳුන්වා දෙන ලදී. මුල් අදියරේදී බීජාංකුර වගාව සියයට 70 සිට සියයට 75 දක්වා නොමැරී පැවැත්මේ ඉහළ අනුපාතයක් දක්වා තිබුණද, සතුන් හා ඌරන් විසින් (අල සඳහා) පහසුවෙන් ඉවත් කර ගත හැකි ඇතැම් විවෘත වගා බිම් ස්ථානවල එය දීර්ඝ කාලයක් නොපැවතුණි. මෙම තත්ත්වය, විවෘත වගා බිම් ස්ථානවල පවත්වා ගැනීමේ අනුපාතය සියයට 10 කටත් අඩු ප්‍රමාණයකට හේතු වී තිබූ අතර වැසුණු ප්‍රදේශවල (යහපත් ආරක්ෂාවක් සහිත වැටවලින් කොටුකරගත් ඉඩම්) පැළ කරන ලද බීජාංකුර පසු අදියරේදීද සියයට 70 ක පවත්වා ගැනීමේ අනුපාතයක් දක්වා තිබුණි.

එබැවින් බීජාංකුර නිෂ්පාදනය පසුගිය වර්ෂයේ අඩු වී තිබුණි. වැටවල් සහිත ඉඩම්වලට පමණක් බීජාංකුර නිකුත් කර තිබූ අතර, ආර්ථිකව ඵලදායී වගාවක් පවත්වා ගැනීමේ අරමුණින් විවෘත ප්‍රදේශවල (මාර්ග දෙපස, පිට්ටනි) වගාව සඳහා බීජ නිකුත් කර තිබුණි.

## 4.2 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වීරවිල ආදර්ශ ගොවිපොළේ නිෂ්පාදනය කරන ලද අත්කම් භාණ්ඩ විෂයයන් සඳහා තිස්සමහාරාම ප්‍රදේශයේ විශාල ඉල්ලුමක් පවතින නමුත් වීරවිල ආදර්ශ ගොවිපොළේ නිෂ්පාදන ධාරිතාව ඉහළ දැමීමට පියවරක් ගෙන නොතිබුණි. තවද ඉහළ ප්‍රවාහන පිරිවැයකට හේතු වන කොළඹ සහ මඩකලපුවෙන් එම විෂයයන් මෙම ගොවිපොළ විසින් මිලදී ගෙන තිබුණි.

(ආ) බඳවා ගැනීම් පරිපාටියේ දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් නොමැතිව අලෙවි හා නිෂ්පාදන කළමනාකරු සහ වෙනත් සේවකයින් 51 ක් පත් කර ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ යාපනය දිස්ත්‍රික්කයේ හැර අනෙකුත් දිස්ත්‍රික් නිලධාරීන් සඳහා ගෙවීම් සම්බන්ධීකාරකගේ පුද්ගලික බැංකු ගිණුම්වලට සිදුකර තිබුණි.

(ඈ) නිෂ්පාදන පිරිවැය ඉහළයාම හා නිෂ්පාදන මධ්‍යස්ථානවල දුර්වල කාර්යසාධනය හේතුවෙන් යාපනය හා මන්නාරම මධ්‍යස්ථානවල තල් කෙඳි නිෂ්පාදනය අඩුවීමේ ප්‍රවණතාවයක් වාර්තා කර තිබුණි.

(ඉ) කොළඹ 04 පිහිටි ගොඩනැගිල්ලේ කොටසක් උපබදු දීම වෙනුවෙන් විදුලි වියදම් මෙන්ම ජල ගාස්තු වියදම් තල් සංවර්ධන මණ්ඩලය විසින් දැරීමට අදාළව 2016 මාර්තු 11 දින පොදු ව්‍යාපාර කමිටුව විසින් දෙන ලද නියෝගය පිළිබඳව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ගොඩනැගිල්ලේ උප - බදු දී තිබූ කොටසට අදාළ බිල්පත්‍ර වෙනම ගෙවූ බවට තහවුරු කිරීම

සඳහා අදාළ ලියකියවිලි විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලෙස ගිණුම් නිලධාරියාට නියෝග කර තිබුණි.

(ඊ) ඉඩම්වල අයිතිය මණ්ඩලයට අයත් නොවූවද රු.7,377,318 ක් පිරිවැය වූ කරෙයිනගර් කර්මාන්ත සංකීර්ණ ගොඩනැගිල්ල හා රු.900,000 ක් පිරිවැය වූ ඩෙල්ෆ්ට් හි කෙඳි නිෂ්පාදන මධ්‍යස්ථානය ගොඩනැගිලි ගිණුමට ප්‍රාග්ධනිත කර තිබූ අතර සමුච්චිත ක්ෂය සඳහා පිළිවෙලින් රු.3,273,527 ක් හා රු.180,000 ක් ප්‍රතිපාදනය කර තිබුණි.

(උ) බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් අරමුදල් සපයන විශේෂ ජීවනෝපාය ව්‍යාපෘති සඳහා දරන ලද රු.29,572,520 ක් සඳහා විස්තරාත්මක වියදම් ප්‍රකාශයක් පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

**4.3** මානව සම්පත් කළමනාකරණය
---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුරප්පාඩු ස්ථිරව පිරවීමට කටයුතු කිරීමෙන් තොරව පුද්ගලයන් 10 දෙනෙකුගෙන් අනියම් පදනම මත අඛණ්ඩව සේවය ලබාගෙන තිබූ බව නිරීක්ෂණය වූ අතර, ප්‍රාථමික මට්ටමේ අතිරික්ත සේවක සංඛ්‍යාව 13 දෙනෙකු සඳහා අනුමැතිය ලබාගැනීමට හා සමාලෝචිත වර්ෂය අවසානයට පැවති පුරප්පාඩු 23 ක් පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 ඔක්තෝබර් 09 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් බඳවා ගැනීම් පරිපාටිය අනුමත කර තිබුණද, පවත්නා සේවක සංඛ්‍යාව නීත්‍යානුකූලව බඳවා ගැනීමට හා බඳවා ගැනීම් පරිපාටිය අනුව වැටුප් ගෙවීමට විධිමත් පියවර ගෙන නොතිබුණි.

(ඇ) බඳවා ගැනීම් පරිපාටියක් නොමැතිව 2011 සිට 2015 වර්ෂය දක්වා තනතුරු 59 ක් සඳහා බඳවා ගැනීම් සිදුකර තිබූ අතර එම කාලපරිච්ඡේදය තුළම 14 දෙනෙකුට විවිධ තනතුරු සඳහා උසස්වීම් ලබා දී තිබුණි.

(ඈ) බඳවා ගැනීම් පරිපාටිය අනුමත කිරීමෙන් පසුවද වැටුප් විෂමතාවයන් සඳහා ගැලපීම් සිදුකර නොතිබුණි.

**4.4** වාහන උපයෝජනය
---------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෝටර් වාහන 4 ක් මඟින් කරන ලද කිලෝමීටර් 19,652 ක ගමන් සඳහා අරමුණ ධාවන සටහන්වල ඇතුළත් කර නොතිබුණි.

(ආ) කිලෝමීටර් 13,547 ගමන් සඳහා මෝටර් වාහන 9 ක දෛනික ධාවන සටහන්වල වාහන පාවිච්චි කරන ලද නිලධාරින්ගේ අත්සන් තබා නොතිබුණි.

(ඇ) 1990 ඔක්තෝබර් 19 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, මෝටර් වාහන 26 ක ඉන්ධන දහනය පරීක්ෂා කිරීම මණ්ඩලය විසින් සිදු කර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

1971 අංක 38 දරන මුදල් පනතේ 14(6) වගන්තිය ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 30 හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2016 ජුනි 06 දිනදීය.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

---------------------

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍ර ලේඛය ප්‍රකාරව වර්ෂය ආරම්භයේදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව මණ්ඩලය විසින් පිළියෙල කර නොතිබුණි. කෙසේ වුවද ඒවා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2016 අප්‍රේල් මාසයේදීය.

(ආ) බීජ හා බීජාංකුර, හකුරු නිෂ්පාදනය, තලප නිෂ්පාදනය හා කෙඳි නිෂ්පාදනයට අදාළව 2015 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ සමහර ඉලක්කයන් ඉටුකර ගෙන නොතිබූ හෙයින් එය ඵලදායී යහපාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

### 5.3 සංයුක්ත සැලැස්ම

--------------------

2015 – 2019 කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් මණ්ඩලය විසින් පිළියෙල කර තිබුණද රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද 2014 පෙබරවාරි 17 දිනැති අංක පීඊඩී/ආර්ඊඩී/01/04/2014/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව 2015 වර්ෂයේදී එය යාවත්කාලීන කර නොතිබුණි.

### 5.4 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.5 අභ්‍යන්තර විගණනය

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් ප්‍රධාන අභ්‍යන්තර විගණක 2015 අප්‍රේල් 24 දින සේවයෙන් ඉවත් කරන ලදී. පසුව, මණ්ඩලයට එරෙහිව ඔහු විසින් නඩුවක් ගොනු කර තිබූ අතර 2016 මාර්තු 11 දින නැවත සේවයේ පිහිටුවන ලදී. මේ සම්බන්ධයෙන් නිලධාරියාට වාසි වන පරිදි තීන්දුව ලබා දී තිබූ හෙයින් ඔහුගේ සේවය අත්හිටුවා තිබූ කාලය සඳහා රු.505,231 ක මුදලක් ඔහුට ගෙවා තිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන නිලධාරීන් දෙදෙනෙකු සහිතව අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කර තිබුණද, එම අංශයේ ඵලදායී මෙහෙයුම් සඳහා වෙනත් කාර්ය මණ්ඩලයක් බඳවා ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වැඩසටහන අනුව, පහත සඳහන් ගනුදෙනු ක්ෂේත්‍ර අභ්‍යන්තර විගණන අංශය විසින් සම්පූර්ණයෙන් පරීක්ෂා කර/ ආවරණය කර නොතිබුණි.

(i) ප්‍රාග්ධන වැඩ කළමනාකරණය
(ii) ජීවනෝපාය ව්‍යාපෘතිය කළමනාකරණය
(iii) අත්තිකාරම් නිරවුල් නොකිරීම.

(iv) වත්කම් කළමනාකරණය

(v) අරමුදල් උපයෝජනය

## 5.6 විගණන හා කළමනාකරණ කමිටුව

-----------------------------------------

මණ්ඩලය විසින් විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර තිබුණද එම කමිටුවේ රැස්වීම් 2015 වර්ෂය තුළ පවත්වා නොතිබුණි. කෙසේවුවද, 2005 ජුලි 01 දිනැති අංක පීඊඩී/31 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සෑම වර්ෂයක දීම අවම වශයෙන් රැස්වීම් වාර 4 ක් පැවැත්විය යුතුය.

## 5.7 අයවැය ලේඛනමය පාලනය

-----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත හා තථ්‍ය ආදායම සහ වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් හා අයවැයගත ඇස්තමේන්තුවලින් තොරව වාහන අත්කර ගැනීම, ලී බඩු හා උපකරණ, ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ සහ රසායනාගාර පරීක්ෂණ උපකරණ අත්කර ගැනීම සඳහා වියදම් ලෙස එකතුව රු.11,524,000 ක් වැයකර තිබූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර නිකුත්කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මඟින් මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. ස්ථාවර වත්කම් පිළිබඳ පාලනයට අදාළව, එනම් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් පිළිබඳ සාධාරණ අගය ඉදිරිපත් කිරීම සහ ස්ථාවර වත්කම් ඵලදායීව උපයෝජනය කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.